# පේරාදෙණිය විශ්වවිද්‍යාලීය
# සෞඛ්‍ය පහසුකම් සහ වෛද්‍ය නිවාඩු
# පටිපාටිය



## ඔබගේ සෞඛ්‍ය සුරක්ෂිතභාවය
## පිණිස අපි කැපවී සිටිමු

සෞඛ්‍ය මධ්‍යස්ථානය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

පේරාදෙණිය විශ්වවිද්‍යාලීය සෞඛ්‍ය මධ්‍යස්ථානයෙහි එකම පරමාර්ථය වනුයේ අප සතු වටිනාම සම්පත වන ඔබගේ කායික මානසික සමාජීය සහ ආධ්‍යාත්මික යහ පැවැත්ම තහවුරු කිරීමයි.

## සෞඛ්‍ය මධ්‍යස්ථානයට ප්‍රවේශ වන මාර්ගය




ඔබ වෙනුවෙන් ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා අංගසම්පූර්ණ කාර්ය මණ්ඩලයක් අප සතුව ඇත.
ප්‍රධාන වෛද්‍ය නිළධාරි -01, වෛද්‍ය නිළධාරි-04, හෙද නිළධාරි -10
ඖෂධවේදීන්-03, හෙද පාලක-01,රසායනාගාර කාර්මික ශිල්පි -02
මහජන සෞඛ්‍යපරීක්ෂක -02, උපකාරක කාර්ය මණ්ඩලය-30

## ඔබ වෙනුවෙන් අප සතු සේවාවන්

(මෙම සියලුම සේවාවන් ඔබට නොමිලේ සැපයේ)

බාහිර රෝගී අංශය

**විවෘතව තබන වේලාවන්**

**සතියේ දිනවල**
පෙ.ව. 8.30-ප.ව.12.15
ප.ව. 1.30-ප.ව.4.15

**සති අන්ත**
පෙ.ව. 9.00-පෙ.ව.11.00

**අභ්‍යන්තර වාට්ටු ප්‍රතිකාර අංශය**

ඔබගේ රෝගි තත්වය අනුව වාට්ටු වලට ඇතුල් වී ප්‍රතිකාර ලබාදීමද සිදුවේ. දවසේ පැය 24 පුරාම රෝගී සිසුන් ඇතුලු කර ගනු ඇත.

ඔබගේ මිතුරු රෝගී සිසුන් වාට්ටුව තුලදී හමුවිය හැකි වේලාවන්

පෙ.ව. 6.30 පෙ.ව. 7.00

දහවල් 12.00 ප.ව. 1.00

ප.ව. 5.00 ප.ව. 6.00

ඔබගේ රෝගි තත්වය අනුව පේරාදෙණිය හෝ මහනුවර රෝහල්වලට යොමු කිරීමද සිදු කෙරේ.

**ගිලන් රථ සේවාව**

ඔබ වෙනුවෙන් පැය 24 පුරාම ගිලන් රථ සේවාවක් ක්‍රියාත්මක වේ. ඔබට හදිසි රෝගි තත්වයක් ඇතිවූ විට(Emergency) උප ශාලාධිපති මගින් හෝ පීඨයේ වගකිව යුතු නිළධාරියෙකු මගින් ඉල්ලුම් කළ හැක.ඉතා සුලු මොහොතකින් ගිලන් රථය ඔබ වෙත පැමිණෙනු ඇත.

**රසායනාගාරය**

අංගසම්පූර්ණ රසායනාගාරයක් ඔබගේ රුධිර මූත්‍රා පරීක්ෂණ සඳහා පවතී.

**ඖෂධාගාරය**

සියලුම ඖෂධ සහ කාර්ය මණ්ඩලයක් සහිත අංගසම්පූර්ණ ඖෂධාගාරයක් ඔබ වෙනුවෙන් පවතී. ඔබට අවශ්‍ය කරන අප සතු නොවන අත්‍යාවශ්‍ය ඖෂධ ඇත්නම් ඒවා එම අවස්ථාවේදීම බාහිරින් මිලදී ගෙන ඔබට සපයනු ඇත.

**ප්‍රතිශක්තීකරණ වැඩසටහන**

ඒ ඒ පීඨවල අවශ්‍යතාවය අනුව සැපයෙන විශේෂ ප්‍රතිශක්තිකරණ වැඩසටහන් ඔබ වෙනුවෙන් ක්‍රියාත්මක වේ.

**උපදේශන වැඩසටහන්**

මානසික පීඩාකාරී තත්වයන් සහිත සිසුන් සඳහා මූලික උපදේශන වැඩසටහන් වෛද්‍යවරුන් විසින් ඔබ වෙත සපයනු ඇත.විශේෂිත අවස්ථාවලදී විශේෂඥ උපදෙස් සඳහා ඔබ යොමු කරනු ඇත.

## රෝග නිවාරණ වැඩසටහන

මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් දෙදනෙකුගෙන් යුත් කණ්ඩායමක් විශ්ව විද්‍යාලය තුල රෝග වැලැක්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක වේ.එනම්,ආහාර ජලය සුරක්ෂතභාවය ,කසල කලමණාකරණය වසංගත රෝග පාලනය පාරිසරික සෞඛ්‍ය ආදිය වේ.

**වැදගත්**

**සිසුන් විසින් වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීම**

ඔබ විශ්ව විද්‍යාලීය සෞඛ්‍ය මධ්‍යස්ථානයේ ප්‍රතිකාර ලබා ගන්නේ නම් ඔබට වෛද්‍ය සහතිකයක් නිකුත් කරනු ඇත. ඔබ වෙනත් බාහිර ස්ථානයකින් ප්‍රතිකාර ලබා ගන්නේ නම් එම වෛද්‍ය සහතිකය සහකාර ලේඛකාධිකාරී හට භාර දිය යුතුය.ඉන්පසු එය අනුමැතිය සඳහා ප්‍රධාන වෛද්‍ය නිලධාරී වෙත එවනු ඇත.

**විභාගයක් පවතින දිනක ඔබ රෝගී වූවහොත් විභාගය ආරම්භ කිරීමට පෙර ඔබ සෞඛ්‍ය මධ්‍යස්ථානය වෙත වාර්තා කල යුතුය.එසේ නැත්නම් රජයේ රෝහලකට වාර්තා කල යුතුය.**

අසනීප තත්වයන් හේතුවෙන් විභාග සඳහා පෙනී සිටිමට නොහැකි අවස්ථාවලදී ඔබගේ වෛද්‍ය සහතිකය ඉදිරිපත් කිරීම හෝ සෞඛ්‍ය මධ්‍යස්ථානයට වාර්තා කල බව සහකාර ලේඛකාධිකාරී වෙත දැන්විය යුතුය.

**විභාග වලට පෙනී නොසිටීම පිළිබඳව පුද්ගලික වෛද්‍ය සහතික භාර නොගැනේ.ඒ සඳහා රජයේ වෛද්‍ය සහතික, විශේෂඥ වෛද්‍ය සහතික , හෝ සෞඛ්‍ය මධ්‍යස්ථානයෙන් ප්‍රතිකාර ලබාගත් බවට වාර්තා පමණක් පිළිගැනේ.**

**සෞඛ්‍ය මධ්‍යස්ථානයේ දුරකථන අංක**

| | | |
|---|---|---|
| ප්‍රධාන වෛද්‍ය නිලධාරී | 2024 | 0812392024 |
| පිළිගැනීමේ කවුළුව | 2022 | 0812388152 |
| මහජන සෞඛ්‍ය පරීක්ෂක | 2023 | 0812392023 |
| ගැහැණු වාට්ටුව | 2026 | 0812392026 |